අල්ලාහ් දඬුවම් කරන ආකාරයෙන් ඔබ දඬුවම් නො කරන්න

ඉක්රිමා තුමා විසින් වාර්තා කරන ලදී. සැබැවින්ම අලී (රළියල්ලාහු අන්හු) තුමා පිරිසක් ගින්නෙන් පුළුස්සා දැමුවේය. එය ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමා වෙත දැනගන්නට ලැබී ඒ ගැන එතුමාගෙන් විමසා සිටියේය. එවිට එතුමා: "අල්ලාහ් දඬුවම් කරන ආකාරයෙන් ඔබ දඬුවම් නො කරන්න" යනුවෙන් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්
පවසා ඇති බැවින් මම ඔවුන් පුළුස්සා නොදමන්නට සිටිය ද නබි (සල්ලල්ලාහු අලයිහි
වසල්ලම්) තුමාණන් 'කවරෙකු දහම වෙනස් කළේ ද ඔබ ඔහුව මරා දමන්න' යැයි ප්රකාශ කර ඇති
නිසා මම ඔවුන් මරා දැමුවෙමි" යැයි පැවසීය. [صحيح] [رواه البخاري]

අලී ඉබ්නු අබී තාලිබ් (රළියල්ලාහු අන්හු) තුමා ඉස්ලාමයෙන් ඉවත් වූ මිථ්යාදෘෂ්ටික අන්තවාදීන් පිරිසක් ගින්නෙන් පුළුස්සා දැමීය. මේ ගැන දැනගත් අබ්දුල්ලා ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමා ඔවුන් මරා දැමීමට ඔහුට සහාය දුන් නමුත් ඔවුන් ගින්නෙන් පුළුස්සා දැමීම ප්රතික්ෂේප කළේය. තවදුරටත් මෙසේ පැවසීය. "ඔහුගේ ස්ථානයේ මා සිටියේ නම් මම ඔවුන් ගින්නෙන් පුළුස්සා නොදමමි. මක්නිසාදයත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ගින්නට හිමි පරමාධිපතියාණන් වූ අල්ලාහ්ට හැර ගින්නෙන් දඬුවම් දීමට වෙනත් කිසිවකුට යුතු නොවන බව පැහැදිලි කර ඇති බැවිනි." නමුත් ඔවුන්ව මරා දැමීම ගැන හෙතෙම සෑහීමට පත් විය. එය සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන්ගේ ප්රකාශය පරිදිය. එනම් කවරෙකු ඉස්ලාමය අත්හැර දමා තම දහම වෙනස් කර, වෙනත් දහමක් වැළඳ ගෙන ඉස්ලාමයට එරෙහිව ක්රියා කළේ ද ඔහුව මරා දමනු යැයි පවසා ඇත්තාහ.

https://sunnah.global/hadeeth/si/show/58227